**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2018/2019**

**BST 2226 – සාහිත්‍ය මූලාශ්‍රය හා බෞද්ධ සම්ප්‍රදාය**

(පැ දෙකයි)

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. "බෞද්ධ ජනයාගේ ආගමික ආස්ථානය සසල වීම වැළැක්වීම පොළොන්නරු කාලයේ විසූ ලේඛකයන්ගේ ප්‍රධාන අරමුණක් විය." එම අවධියේ රචනා කරනු ලැබූ ග්‍රන්ථයක් ඇසුරෙන් ඉහත කියමන විභාග කරන්න.

2. දඹදෙණිය ජන සමාජය අකුසලින් දුරු කරවා කුසල්හි පිහුටුවීමේ දැඩි අවශ්‍යතාවක් පැන නැගී තිබුණු බව ඒ කාලයේ රචිත එක් ග්‍රන්ථයක් නිදර්ශන කොට ගනිමින් විමසන්න.

3. "ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව නිසා සිංහලයන් අතර විවිධ චාරිත්‍රවාරිත්‍ර වර්ධනය විය"මේ සම්බන්ධව ලියනු ලැබූ ග්‍රන්ථයක් නිදර්ශනයට ගෙන ඉහත කියමන සාකච්ඡා කරන්න.

4. සාමාන්‍ය ජනතාවට පුනර්භවය හා කර්මය ක්‍රියාත්මක වන ආකාරය පහදා දීම ජාතක කථාවලින් ඉටුවූ ප්‍රධාන කාර්යයක් වූ අයුරු නිදර්ශන පහක් වත් ඇසුරු කරගෙන සාකච්ඡා කරන්න.

5. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් පරිහානියට ගිය බුද්ධ ශාසනය ද භාෂා ශාස්ත්‍ර ද නගා සිටුවීම සඳහා ගත් ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න.

6. බෞද්ධ භික්ෂු සමාජය තුළ ඇති වූ නැගීම් හා බැසීම් වටහා ගැනීමට කතිකාවත් වලින් ඉටු වූ මෙහෙය පරීක්ෂා කරන්න.

******************************